**ශීර්ෂය - 011 - මුදල් කොමිෂන් සභාව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 011 - මුදල් කොමිෂන් සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මුදල් කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 11 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජුනි 08 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට මුදල් කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) දේපළ පිරියත හා උපකරණ**

දේපළ පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දේපළ පිරියත හා උපකරණ වටිනාකම රු.800,142,912 ක් වුවද මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ එම වටිනාකම රු.800,202,910 ක් ලෙස දක්වා තිබීමෙන් සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය නොවන වත්කම් ශේෂය රු.60,000 කින් වැඩියෙන් දැක්විණි. | මෙම රු.60,000 ක වෙනස වත්කම් අපහරණයට අදාල වන අතර මෙය නිවැරදිව ගිණුම් තැබුවද සිගාස් යෙදවුමෙහි දෝෂයක් මත වත්කම් රු.60,000 ක් වැඩියෙන් පෙන්වා ඇත. ඉදිරියේදී ගිණුම් සැකසීමේදී මේ පිළිබඳව අවධානය යොමු කිරීමට කටයුතු කරමි. | අවසන් භාණ්ඩාගාර මුද්‍රිත සටහන් සංඛ්‍යා පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කලයුතු වේ. |

**(ආ) අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ ශේෂය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) අනෙකුත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් කොමිෂන් සභාව විසින් රු.2,785,832 ක්වූ ආදායම් එකතු කර තිබුණද අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ එය | අතපසුවීමකින් වෙනත් ආයතන විසින් වාර්තාකරන ආයතනය වෙනුවෙන් එකතු කරන ලද ආදායම් ලෙස සටහන් වී ඇති රු.2,785,832 | අග්‍රිම සැසඳුම් ප්‍රකාශය නිවැරදිව පිළියෙල කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | වෙනත් ආයතන විසින් කොමිෂන් සභාව වෙනුවෙන් එකතුකරන ලද ආදායමක් ලෙස දක්වා තිබුණි. | අනෙකුත් ආයතන වෙනුවෙන් එකතු කරන ආදායම් ලෙස නිවැරදි විය යුතුය. | |
| (ii) | අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ එකතු කිරීම් ලෙස දැක්විය යුතු කොමිෂන් සභාව විසින් අනෙකුත් වැය ශීර්ෂ වෙනුවෙන් වැයකර තිබූ රු.2,100,265 ක් සහ අනෙකුත් වැය ශීර්ෂ විසින් රජයේ නිලධාරීන්ට අත්තිකාරම් “බී” ගිණුමට බැර කර තිබූ රු.446,560 ක් අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ අඩුකර දක්වා තිබුණි. | අතපසුවීමකින් මෙසේ සටහන් වී ඇත. | අග්‍රිම සැසඳුම් ප්‍රකාශය නිවැරදිව පිළියෙල කළ යුතු වේ. |
| (iii) | අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ අඩු කිරීම් ලෙස දැක්විය යුතු වෙනත් ආයතන විසින් කොමිෂන් සභාව වෙනුවෙන් වැයකර තිබූ රු. 65,460 ක් සහ වෙනත් ආයතන විසින් රජයේ නිලධාරීන්ට අත්තිකාරම් “බී” ගිණුමට හර කර තිබූ රු. 359,944 ක් එකතු කර දක්වා තිබුණි. | අතපසුවීමකින් මෙසේ සටහන් වී ඇත. | අග්‍රිම සැසඳුම් ප්‍රකාශය නිවැරදිව පිළියෙල කළ යුතු වේ. |
| (iv) | ඉහත නිරීක්ෂණ අනුව 2022 දෙසම්බර් 31 දිනට අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ ශේෂය රු.664,410 ක ඍණ අගයක් වුවත් එය රු.664,410 ක ධන ශේෂයක් ලෙස නිරූපනය විය. එම නිසා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ රු.664,410 ක්වූ ඍණ ශේෂයට අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ ශේෂය සමාන වී නොතිබුණි. | 2022 දෙසැම්බර් 31 දිනට අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ ශේෂය ඍණ රු.664,410 ක් ලෙස නිවැරදි විය යුතුය. | අග්‍රිම සැසඳුම් ප්‍රකාශය නිවැරදිව පිළියෙල කළ යුතු වේ. |

## 2. මෙහෙයුම් සමාලෝචනය

### 2.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 වර්ෂයේ ආරම්භ කර තිබුණු කොමිෂන් සභා පනත සකස් කිරීමේ කටයුතු 2022 වර්ෂය අවසන් වන විටත් නිම කර නොතිබුණි. | ඉදිරියේදී සිදුවිය හැකි නව ව්‍යවස්ථා සංශෝධනයෙන් පසුව මේ පිළිබඳ ඉදිරි කටයුතු කළ හැකි බැවින් එතෙක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ලබාදී ඇති ප්‍රතිපාදන අනුව කටයුතු කරගෙන යන ලෙස කොමිෂන් සභාවේ සභාපතිතුමන්ගෙන් උපදෙස් ලැබී ඇත. | පනත සකස් කිරීමේ කටයුතු සිදු කළ යුතු වේ. |

### 2.2 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(i)** 2021 දෙසැම්බර් මාසයේ සේවය හැරගිය නිලධාරිනියකගෙන් අය කර ගත යුතු රු.183,440 ක්වූ ණය ශේෂය විගණිත දිනය වූ 2023 මාර්තු 13 දින වන විටත් අය කරගෙන නොතිබුණි. | මෙම නිලධාරිනියගෙන් ණය මුදල් අය කර ගැනීම සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුව හරහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | හිඟ ණය ශේෂ කඩිනමින් අයකර ගත යුතු වේ. |
| **(ii)** 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන අයවැය චක්‍රලේඛයේ 3.2 ඡේදය ප්‍රකාරව නිලධාරියකු පළාත් සභාවකට ස්ථාන මාරුවී යන්නේ නම් අදාළ පළාත් සභාවෙන් එකවර ණය මුදල් අය කර ගත යුතු වුවත්, මධ්‍යම පළාත් සභාව වෙත ස්ථාන මාරුවී ගිය එක් නිලධාරියකුගෙන් අය විය යුතු රු.207,432 ක්වූ ණය ශේෂය විගණිත දිනය වූ 2023 මාර්තු 13 දින වන විටත් අය කරගෙන නොතිබුණි. | මධ්‍යම පළාත් සභාව වෙත මේ පිළිබඳව නිතර නිතර දැනුම් දෙන ලද අතර අත්තිකාරම් බී ගිණුම සඳහා භාණ්ඩාගාරයෙන් මුදල් ලබාදුන් විගස අදාල ණය ශේෂය සඳහා මුදල් ලබාදෙන බව ඔවුන් විසින් දැනුම් දෙන ලදී. | හිඟ ණය ශේෂ කඩිනමින් අයකර ගත යුතු වේ. |

## 3. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ කොමිෂන් සභාවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 02 ක්, තෘතීයිය මට්ටමේ පුරප්පාඩු 02 ක්, ද්විතියික මට්ටමේ පුරප්පාඩු 05 ක් හා ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 03 ක් පැවතුණි. | ජ්‍යෙෂ්ඨ හා තෘතීයික මට්ටමේ පුරප්පාඩු සම්පූර්ණ කරන ලෙස රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් ඉල්ලීම් කර ඇති අතර ද්විතියික මට්ටමේ පුරප්පාඩු සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය දැනුවත් කර ඇත. ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු සඳහා බහු කාර්ය සංවර්ධන කාර්ය සාධන බලකායෙන් අනුයුක්ත කරන ලෙස අග්‍රාමාත්‍ය කාර්යාලයෙන් ඉල්ලීමක් කර ඇත. | කාර්යසාධනයට අහිතකර ලෙස බලපාන පුරප්පාඩු පවතීනම් ඒවා සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතු වේ. |